# Living the Lotus

Buddhism in Everyday Life

3
2022
VOL. 198



## Founder's Reflections

## අභිමානවත් සංවිධානයක් උදෙසා

රිෂ්ෂෝ කෝසෙයිකායි සංවිදනයේ 60 වන සංවත්සර උත්සවය ඔබලා සමග සතුටින් සමරන්නට හැකියාව ලැබුනා.

වර්තමානයේ අභාවප්ප්‍රාප්තව සිටින තෙන්දයිසසු නම් ආගමික සංවිදනයේ යමද එතයි ප්‍රධාණිතුමා. 'නිවානෝතුමා සෑම විටම අව්‍යාජව ඉතාමත් උනන්දුවෙන් කටයුතු කරන නිසා, විශාල අනුගාමීන් පිරිසක් ඔබවටා සිටිනවනෙ. ගිහියන් ලෙස මේ ආකාරයට කටයුතු කරනවා කියන්නේ ස්තුතිවන්ත කාරණයක්' යැයි පැවසා තිබුනා.

සියළු සත්වයන්ව සතුටට පත්කල හැකි වටිනා ධර්මයක් අපිට ලැබී තිබේ, එය 'අපි සෑම කෙනෙක් සමඟම බෙදගත යුතුයි' එබැවින්, මා ගැනවත් නොසිතා ධර්මය වඩා වැදගත්කොට සළකමින් පැමිණියා. එය අන් සියල්ලටම වඩා ජීවත් වීමට මහත්වූ අභිමානයකි. කෝසෙයිකායි සංවිධානයේ ජීව ශක්තියේ උල්පත එයයි.

'රෝමානු ජාතිකයන්, රෝමය අති විශාල ප්‍රසිද්ධ රාජ්‍යයක් නිසා රොමයට ආදර කලා නොවේ. රෝමානුවන් රෝමයට මහත්සේ ආදරය කල නිසා රෝමය ප්‍රසිද්ධ වගේම විශිෂ්ඨ රාජ්‍යායක් බවට පත්ව තිබේ.' යන කියමන බ්‍රිතාන්‍ය ජාතික විචාරකයෙකු වන 'ටෙස්ටර්ටන්' මහතා ප්‍රාකාශ කර තිබේ. ඉතාමත් වැදගත් වනුයේ මේ කරුණයි.

ඔබ සැමදෙනාගේම ශක්තියෙන්, කෝසෙයිකායි සංවිධානය තව තවත් අභිමානවත් වූ සංවිධානයක් කිරීමේ විශාල කාර්‍යභාරය අපිට පැවරී තිබේ.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 11, P. 126-127

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus
Vol. 198 (March 2022)

Senior Editor: Keiichi Akagawa
Editor: Jigjidkhorloo Gereltuya
Copy Editors: Ruklanthi Palipana,
Sahan Chamara , Rajitha Madurangha

*Living the Lotus* is published monthly
by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international
@kosei-kai.or.jp

Living the Lotus-Buddhism in Everyday Life（සද්ධර්ම පුණ්ඩරික සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.）යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදාහැරීම සිදු කරනු ලැබේ.

# ආශිර්වාදයේ බීජ වැපිරීම - 3

නිවිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



## ''ජිසයි පදනමේ'' විස්තරය

තායිවානයේ “මෛත්‍රියේ ජිසයි පදනම” නමින් පුණ්‍යායතනයක් තිබේ. 2007 වර්ෂයේ නිවානෝ සාම ත්‍යාගය ලබා ගත් ෂෝගොන් භික්ෂුව පූර්වගාමියා ලෙස 1966 දී පිහිටුවන ලද එම පදනම, කුඩා සේවා කණ්ඩායමක් බව පෙනී ගියද, අද මිලියන 4 කට වඩා වැඩි සාමාජික සංඛ්‍යාවක් සිටින ජාත්‍යන්තර රාජ්‍ය නොවන බෞද්ධ ආයතනයක් ලෙසට පත් වී ඇත. එසේම ආපදා සහනවලට අමතරව ලොව පුරා විවිධ ක්ෂේත්‍රවල ස්වේච්ඡා ක්‍රියාකාරකම් සංවර්ධනය කරමින් සිටියි.

අප පිළිපදින අයුරින්ම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් මත පදනම්ව, එසේම එහි නමින්ම හැඟවෙන පරිදි “මෛත්‍රී සහගත ජීවිතයක් පෙරදැරිව” (බුදු රජුන්ගේ මහා කරුණා ගුණ හදවතින් සියලු ජනී ජනයාට පිහිට වීම) අරමුණු කර ගත් එම සංවිධානය ගැන මා බෙහෙවින් තෘප්තියට පත් වුනේ, “උදව් උපකාර අවශ්‍ය පුද්ගලයන් සිටින නිසා, එම උපකාර සේවාවේ යෙදීමට අවස්ථාවන් උදාවෙනවා” යන එම සංවිධානය විසින් කියාදෙන කරුණටය. එමෙන්ම ‘සියළු සත්වයන්ව දුකින් මුදවා ගැනීමේ’ අරමුණ පෙරදැරි කරගත් එම සංවිධානයේ ස්වේච්ඡා සේවාවන්ට සහභාගී වීම සහ පරිත්‍යාග කිරීම තුළින් මෛත්‍රියේ හදවත වර්ධනය කර ගැනීමටත්, කෘතවේදීත්වයෙන් සහ ප්‍රීතියෙන් එම ක්‍රියාකාරකම් සඳහා දායකවීමට හැකිවීම ඉතාමත් වටිනා බව මම සිතමි. එම කරුණ, අප සංවිධානයේ “එක්වරු දානමය ක්‍රියාවලිය” හා සමාන වනවාසේම, එයට පදනම් වු කරුණු අදටත් පවසයි.

එම සංවිධානයේ පූර්වගාමියා වූ ෂෝගොන් භික්ෂුව, ස්වෙච්චා සේවාවේ යෙදී සිටින සෙසු සාමාජිකයින්ට උණ බටයයෙන් සෑදූ කැට ලබා දී, “ආහාර ව්‍යංජන පිණිස කරන වියදමින් ස්වල්පයක් අඩු කොට, සෑම දිනකම මවෝ 5 ක් (යුවාන් බාගයක්, රුපියල් 15 ක් පමණ) මෙම උණ කැටයට දමා ඉතිරි කරමු” යැයි පැවසූ විට, එක්තරා පුද්ගලයකු “එහෙම නම්, මාසයටම සරිලන ලෙස එක්වරම යුවාන් 15 ක් පරිත්‍යාග කිරීම වඩා හොඳ නොවේද” යනුවෙන් විමසුවා. එයට ෂෝගොන් භික්ෂුව මෙලෙස පිලිතුරු දුන්නා.

‘සෑම දිනකම, මවෝ 5 ක් උණ කැටය තුලට දමන්නාවූ වාරයක් පාසා, සියළු සත්වයන්ව දුකින් මුදවා ගන්නවා යන හැගීමට පත්විය යුතුය. මවෝ 5 ඉතිරි කරන්නේ යම් සේද, එසේම පුද්ගලයන්ට ආදරය කිරීමත්, ඔවුනට පිහිටවීමේ සිතුවිල්ලද හදවතේ ඉතිරි කර ගැනීමද සිදු කල යුතුය.’

දානමය ක්‍රියාවලිය තුල විශේෂයෙන්ම මුදල්මය දානය තුල මෙම හැඟීම ඉතාමත් වැදගත් වන නිසා, අපිටද ඉතාමත් වැදගත් කරුණක් මෙයින් කියාදෙනවා යැයි සිතමි.

## ආශිර්වාදයන් හා යහපත් ගුණදම් නිර්මාණය කරන්නාවූ සංවිධානයක් බවට පත්වීමට

දුකට හා පීඩාවට පත් වූ පුද්ගලයන්ට පිහිට වීම තම විමුක්තියට මෙන්ම තම චිත්ත ප්‍රීතියටද හේතු වන්නා වූ කරුණක් වේ. එම උතුම් සිතිවිල්ල සියලුම සාමාජික ඔබ සැම දෙනා විසින්ම මනාව සිතට ගෙන, හදවතින් හට ගන්නා වූ චිත්ත ප්‍රීතියෙන් යුක්තව දාන පරිත්‍යාගය සිදු කල යුතු වේ. එපමණක් නොව, මෙම උතුම් වස්තු සම්භාරය තම දෛනික ජීවන රටාවේ ක්‍රම ක්‍රමයෙන් වර්ධනය කොට තැන්පත් කර ගත යුතු වේ. ගිය මාසයේ දහම් පණිවුඩයෙන් පෙන්වා දුන් පරිදි, ධනය යනු රැස් කල යුතු දෙයක් වන අතර, එයින් දානමය පරිත්‍යාග සිදු කිරීම මිනිසත් බවේ අරමුණක් විය යුතු අතර, එය තම ජීවන රටාවට නව අරුතක් ගෙනදෙයි.

එය තව දුරටත් පවසනවානම්, දානමය ක්‍රියාව තුලින් තම යහපත සැලසෙනවා මෙන්ම, අන් අයට උපකාර කිරීම යන කරුණු දෙක එක් වූ තැන මනුෂ්‍යයෙක් වශයෙන් උතුම්ම සන්තෘෂ්ටියට පත් වන බවයි.

නමුත් කුමන අයුරකින්වත් මහා පරිමාන දන් දීම තුලින්, මහත් වූ ආනිශංස නොලැබෙයි. බෞද්ධ සූත්‍ර ග්‍රන්ථ වල පවා "කෙතරම් සුළු දෙයක් වුවද, ශ්‍රද්ධාව පෙර දැරිව කරනු ලබන දානමය පරිත්‍යාගය තුලින්, දානය ලබන පුද්ගලයාගේ යහපතට හේතු වන්නා සේම, දාන පතියාද සුවපත් වනබව" මනාව පැහැදිලි කර ඇත.

සුවපත් වීම යනුවෙන් අදහස් වන්නේ, අතිමහත් චිත්ත ප්‍රීතියට පත්වීම මෙන්ම, සුවපත් සිතුවිල්ලක් ඇතිවන පුණ්‍යකර්මයකටද හේතු වේ. මිනිසුන්ගේ සිත් සතන් මුව පුරා සිනහවකින් පිරී, කුමන අයුරක හෝ චිත්ත සන්තාපයක් නොමැතිව හදවතින්ම ප්‍රීතිය භුක්ති විදීමට හැකිවීම, තමන්ගේ ජීවන ශක්තිය බවට පත්වේ. එසේ වනවිට, එම චිත්ත ප්‍රීතියේ සිතුවිල්ල නැවත වරක් භුක්ති විදීම සදහා, තමා විසින්ම, "දානමය පරිත්‍යාගයන් සිදුකරමි" යන සිතුවිල්ලට පත්වනවා නොඅනුමානයි.

එසේම දානයන් සිදුකරමින්, දානමය බීජ වපුරන්නේ නම් පසු කාලීනව එය ඵලදාව ලෙසින්, ආශිර්වාදයන් හා යහපත් ගුණදම් නිර්මාණය කරන බවට අප සංවිධානයද අතීතයේ සිට පවසයි. අප සංවිධානයද සාමාජිකයන්ගෙන් ඉතා වටිනා දානමය පරිත්‍යාග ලබාගන්නා විට, ඒවා මනුෂ්‍යාන්ව දුකින් මුදවා ගන්නා ආශිර්වාදයන් හා යහපත් ගුණදම් බවට වර්ධනය කළ යුතුය. ඔබ සියළුදෙනාගේ බලපොරොත්තු හා ප්‍රාර්ථනාවන් මෙන්ම මෛත්‍රීය හා කරුණාවද අන්තර්ගතවී එම දානමය බීජයන්, උපරිම ප්‍රයෝජන ගත හැකි ආකාරයට වර්ධනය කරන්නේ කෙසේද යන වගකීමද සංවිධානයට භාරව තිබේ.

මෙහිදී තම ක්‍රියාකාරකම් ගැන අධිමනයෙන් නොසිටින්නේද, තමා හුදෙක් නිවැරදි යැයි සිතා සිටින්නේද, නිශ්ඵල දෑ නොකරන්නේද, දුකින් මුදවා ගන්නා ලෙසින් පිහිට පතන අයගේ හඬ නිවැරදිව ඇසෙන්නේද, හැම දෙනාම ධර්මයේ සතුට අත්විදිනවාද යන කරුණු නැවත වරක් හොදින් විමසා බලමින්,  සාමාජිකයන්ගෙන් ලැබෙන පරිත්‍යාග උපරිම ප්‍රයෝජන ලැබෙන ලෙස භාවිතා කල යුතුය. ඒ තුලයි රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය නම් කුඹුරේ  දානමය බීජ වපුරන පුද්ගලයන්ගේ සතුට රදාපවතින්නේ. එම කරුණ අප සංවිධානයේ සංවත්සරය උදාවන මෙම මාසයේ නැවත වරක් හොදින්

From *Kosei*, March 2022.

# Spiritual Journey

## සතුටේ මාවත

**හවායි ධර්ම ශාඛාවේ**

**ක්‍රිස් ක්‍රෙස්ගෙ මහතා**

මෙම සෙප්පෝව, 2021 වර්ෂයේ 04 වන මස 04 වන දින හවායි ධර්ම ශාඛාවේ පවත්වන ලද, බුදුන් වහන්සේගේ ඉපදීම, සැමරුම් උත්සවයේදී ඉදිරිපත් කරන ලද්දකි.

හැමෝටම සුභ දවසක් වේවා.මගේ නම ක්‍රිස් ක්‍රෙස්ගෙ. මට වයස අවුරුදු 34 ක් වෙනවා. අද දින මෙලෙස ඔබ ඉදිරියේ සෙප්පෝව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන හදවතින්ම ස්තුතිවන්තවෙමි.

මම මේ වනතෙක් ලබපු අද්දකීම් තුලින්, අවසානයේ ඕනෑම දුකක් ස්තුතිවන්තව බාරගත හැකි පුද්ගලයෙකු බවට පත්වූවා කියා සිතනවා. ඉගැන්වීම් වල ආශිර්වාදයෙන් මා සිතුවාට වඩා හොඳ ජීවිතයක් ගතකරන්න පුළුවන් වෙලා තියනවා.

මීට අවුරුදු 3 කට පෙර, මා අවුරුදු 2 ක් සිටි සිරගෙදරින් සීමා සහිතව නීතිරීතිවලට යටත්ව නිදහස් කලා. එය සිරකරුවන් පුනරුත්ථාපනය කිරීම අරමුණු කරගත් නීතිරීති අවම කරන ලද බන්ධනාගාරයකි. මේ වන විට, මා වසර 10 ක මගේ සිර දඬුවමේ අවසන් මාසය ගතකරමින් සිටිනවා. දැන් මේ විදියට ඔබ ඉදිරියේ සිටගෙන සිටියත්, වයස අවුරුදු 13 න් පසු සිරගෙදරින් එළියේ සිටින දීර්ගතම කාලය මේ ගෙවන අවුරුදු 3 ක කාලයයි.

මා කුඩා කාලයේ මගේ පවුලේ අය නිතරම මගේ ලගින්ම සිට මාව බලාගත්තා. තාමත් එය එලෙසම වේ. මගේ පියා වරායේ ආරක්ෂක නිළධාරියකු ලෙස කටයුතු කල අතර, මව ලිපිකාරිනියක ලෙස සේවය කලා. මට මානසික ආබාධයකින් පෙළෙන වැඩිමහල් සහෝදරියක් සිටින මුත්, ඇය ලොකයේ විශාලම හදවත් ඇති අයගෙන් එක් අයෙකි. පවුලේ අය නිතරම විවෘත අදස් ඇති අය වූ අතර, අපි තවමත් හැමදම සෑම කෙනෙක්ම එකට එකතුවී කතාබහ කරනවා. එකිනෙකාට උදවු කිරීමේ හැගීම වැදගත් කොට සලකන පවුලක සාමාජිකයකු ලෙස, මමත් පවුලේ කටයුතු වලට ශක්තියක් වූ අතර, කුඩා කාලයේ සිටම 'දනයේ' වැදගත්කම ඉගෙන ගත්තා.

ඒ අතර, දෙමාපියන් විසින් බේස්බෝල්, පාපන්දු, ආත්ම ආරක්ෂක සටන් කලාව වැනි ක්‍රීඩාවන් උගන්වනු ලැබුවා. නමුත් මා විවිධ හේතූන් නිසා විවිධ දේ ගැන සොයමින් සිටියා.

එලෙස සිටි මා, වයස අවුරුදු 10 ක 11 ක වැනි කුඩා කාලයේදීම වැරදි නිසා නීතිය හමුවට ගොස් ඇගිලි සළකුණු ලබා දීමට පවා සිදුවිය. කුඩා කාලයේ සිටම මා යමක් ගැනීමේදී එහි හොඳම දේ ලබාගැනීමට ඕනෑම දෙයක් කල ළමයෙක් වූවා. අන් අයට ඊරිසියා කරන, එක ලෙස සිතන මිතුරන් සමග එක් රොක් වී සිටියා. ප්‍රාථමික පාසල් අධ්‍යාපනය අවසන් වූ විගස අසල්වාසී මිතුරකුගෙන් මත්ද්‍රව්‍ය විකිණීමට ලැබුණු ආරාධනයත් සමග එයට ගිය මගේ ජීවිතය අගාධයකට ඇද වැටුණි. එක් රැයක් ඇතුලත මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ අතර, දෛනික ජීවිතය තුල, සොරකම්, මැරකම් සහ මංකොල්ලකෑම් වැනි විවිධ අපරාධ සිදු කලා. ආරම්භයේ සමීපතම මිතුරා සමග දෙදෙනාගේ වැඩ සඳහා සොරකම් කලද, පසුව මා තනිව මා වෙනුවෙන් අපරාධ කිරීමට පටන් ගත්තා.

වයස අවුරුදු 16 දී කොල්ලකෑම් වලට වරද කරුවකු ලෙස 19 වන උපන්දිනය දක්වා, හවායිහි, තරුණ පුනරුත්ථාපන කදවුරක සිර ගත කරන ලදි. මේ තුල මගේ වයසේම බොහෝ තරුණ පිරිසක් සමග සීමා සහිත වූ පරිසරයකට හැඩ ගැසෙමින් ඉගෙන ගත්තා. 19 වන උපන්දිනය දින ලගාවී නිදහස් වීමට සිටින අවස්ථාවේ තහනම් දුම්වැටියක් ලග තබාගෙන හසුවීම නිසා නැවත කාලය දිගු විය. අවසානයේ මා නිදහස් වන විට, වැඩිහිටියකු වූ අතර පරිවාසයට ලක්ව සිටියෙමි.



සෙප්පෝව ඉදිරිපත් කරන ක්‍රිස් ක්‍රෙස්ගෙ මහතා.

කෙසේ වෙතත්, නිදහස්ව පැමිණි පසු නැවත සිරගෙදරට යාමට බිය නොවූ නිසා, අපරාධ වල වෙනසක් නොවීය. සිරගෙදර ජීවිතයට පුරුදුව සිටි නිසා නැවත සිර ගතවීමට සිදුවීම ගැන තැකීමක් කලේ නැත. මා නිදහස් වූ පසු නිවරදිව සිටිය යුතුයි යන්න ගැන අවබෝධයක් ද, නොවීය.

මේ අනුව, වයස 19 දි පරිවාස කොන්දේසි කඩකල නිසා නැවතත් වසර 10 ක් හලාවා පුනරුත්ථපන මධ්‍යස්ථානයේ සිරගතවීමට සිදුවිය.

ඇත්ත වශයෙන්ම, මෙම තීරණයට පෙර මගේ වැරදි නිවැරදි කරගැනීමට රජයෙන් අවස්ථාව ලබා දුන්නා. එහි කොටසක් ලෙස විවිධ උපදේශන සහ ප්‍රතිකාර ලබා දුන්නා. නමුත් ඒ කිසිවක් පළක් නොවීය. එබැවින්, වැඩසටහනේදී අසන ලද ප්‍රශ්න වලට නිවැරදිව පිළිතුරු ලබාදී, ප්‍රතිකාර ඵලදයී බව දැනෙන්නට හැර වැඩසටහන කලින් අවසන්කර නිදහස් වීමට අරමුණු කර ගත්තා. එසේ කර, මා 'කීකරුම සිසුවා' බවට පත්ව සියලූම වැඩසටහන් වලින් සමත්ව ඉක්මනින් නිදහස ලබාගත් වහාම ඊලග අපරාදය සැලසුම් කලේය.

හලාව පුනරුත්ථපනය මධ්‍යස්ථානයේ සිරගතව සිටියදී, එකට දඩුවම් විදපු මිතුරන් සමග නැවත එක් වූවා. සිරගෙදරින් නිදහස්ව පැමිණි පසුත් මා ඔවුන් සමග සම්බන්ධතාවය පවත්වා ගත්තා. කෙසේ වෙතත්, හිරගෙදරදී බොහෝ සේ සමීප වූ මිතුරන් මිනීමැරුම්, සියදිවි හානි කර ගැනීම් සහ විවිධ රෝග වලින් මියගිය අතර, සමහරුන්ට ජීවිතාන්තය දක්වා සිරගතවීමට සිදුවිය.

වයස අවුරුදු 27 දී මට නැවත නිදහස ලබා ගැනීමට හැකි වුනා. මම බන්ධනාගාරයෙන් පිටත වැඩ කරමින් එදිනෙද ජීවන වියදම මා විසින්ම උපයා ගැනීමට පටන් ගත්තා. ජීවිතයේ පළමු වතාවට නීත්‍යානුකූලව මුදල් උපයන රැකියාවක් ලැබුණා. කෙසේ වෙතත්, නරක මිතුරන්ගේ ආශ්‍රය නිසා, නැවත පරණ ජීවිතයට හුරුව වැරදි කිරීම නිසා නැවතත් සිරගත වීමට සිදුවිය.

එහිදී, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ සිරකරුවන් සඳහා වන උසස් ප්‍රතිකාර වැඩසටහනකට සහභාගී විය. උපදේශක මහතාගේ මගපෙන්වීම යටතේ, අධ්‍යාත්මික දේ පිළිබදව ඉගෙනීමට ලැබුනු අතර, කිසියම් හේතුවක් නිසා එය මගේ ජීවිතය වෙනස් කරගැනීමට ලැබුණු අවස්ථාවක් ලෙස සිතුවා. ඒ කාලයේදීම මා බුදුදහම ගැන පොත් පත් කියවීමට පටන් ගත් අතර, එය මගේ නව ජීවන ගමනේ ආරම්භය වූවා.

ඒ කාලයේ දී, සිරගෙදර පැවැත්වුනු බෞද්ධ වැඩසටහනකට සම්බන්ධ විමට අවස්ථාවක් ලැබුණු අතර, එහිදී මට රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ස්වෙච්ඡා සේවකයකු වූ ජෝආන් ඔසාකි මහත්මියව මුණ ගැසුණා. මට අවශ්‍ය වූයේ ඇයගෙන් හැකිතාක් බුදුදහම ඉගෙන ගැනීමටයි. මම හොඳින් ඉගනගෙන අනෙක් සිරකරුවන් සමගත් බෙද ගත්තා. මොනයම් හේතුවක් නිසා හෝ මට බෞද්ධ ඉගැන්වීම් වල හුරුපුරුදු බවක් දැනුණු අතර, මගේ අභ්‍යන්තරය සමග සම්බන්ධ වීමට හැකිවූවා. ජොආන් මහත්මිය මගේ ජීවිතයේ විවිධ පැති ගැන උපදෙස් දුන් අතර, එදිනෙද ජීවිතය තමන්ටත්, අන් අයටත් ප්‍රයෝජනවත් සහ සුභදයක ලෙස ගෙවන්නේ කෙසේද කියා ඉගැන්වූවා.

මම 'ගිනිගත් නිවසේ උපමාව' ගැන ඉගෙන ගැනීමෙන්, මෙතෙක් ජීවිතය තුල මට ලැබුනු 'බුදුන් වහන්සේගේ කරුණාව' ගැන අවබෝධ කරගැනීමට හැකි වූවා. තවද සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ ඇති 'උපමා කතාවන්' මගින් ධර්මය ගැන ගැඹුරු අවබෝධයක් ලබාගැනීමට හැකිවූවා. ඒවගේම අන් අයට වැඩදයී පුද්ගලයකු වීම, අවංක වීම, සෑම දිනයක්ම හැම මොහොතක්ම වැදගත් කොට සැලකීම තමන්ට සතුටක් ගෙන එන බව වැටහුණා. මෙම බුද්ධ මාර්ගයේ ගමන් කරමින් ජීවත් වීමට මා තිරණය කර, සිරගෙදරදී ඉගෙන ගත්දේත් මා අවට සිටින අය සමග බෙද ගත්තා. එවිට මා ඉගෙන ගත් දේ අන් අයට මෙන්ම මටත් තදින් මතකයේ තබා ගත හැකි බව තේරුම් ගියා.

මම 2019 වර්ෂයේ මාර්තු මස නිදහස ලබා මාගේ දෙමාපියන්ගේ නිවසට ගියා. පැරණි මිතුරන් සියලූම දෙනා අමතක කර පර්ල් නගරයේ පිහිටි රිෂ්ෂෝ කෝසෙයි කායි ධර්ම ශාඛාවට, දිනපතාම ගියා. ධර්ම ශාඛාවේ හැමදෙනෙක්ම මාව උණුසුම් ලෙස පිළිගත් අතර, තවමත් එම පිළිගැනීම ගැන සතුටුවෙමි. ධර්මය ප්‍රායෝගිකව පුරුදු පුහුණු කිරීම ආරම්භ කල ද සිට, මගේ ජීවිතයේ සෑම දවසක්ම ආලෝකමත් විය.

ධර්ම ශාඛාවේ විවිධ ක්‍රියාකාරකම් වලට සහභාගී වීමට හැකිවීම, ඉතාමත් විනෝදජනක අද්දැකීමක් වේ. මම තරුණ කණ්ඩායමේ ක්‍රියා කරන අතර, හෝසා තුලදී අසන අද්දැකීම් මගේ ජීවිතයට බද්ධ කරගනිමින් සිටිනවා. සෑම මාසයකම ZOOM තාක්ෂණය ඔස්සේ පවත්වන වැඩසටහන් වලට සහභාගී වෙමින්, අලුත් දේවල් ඉගනගනිමින්, සද්ධර්ම පුණ්ඩරීක සූතයේ පරිච්ඡේදයන් වල අන්තර්ගතය නැවත පුණරීක්ෂනය කරමින් සිටිනවා.

ඉරිද දිනයන්හිදී ධර්ම ශබාවට ගොස්, එහිදී සිදු කරන මූලික රාජකාරීන් ගැනද, ඉගෙනගත්තා. ධර්ම ශාඛාවේ විශේෂ අවස්ථාවන් වලදී උදවු කිරීමට ලැබීමද, විශාල සතුටක් ගෙනෙනවා. මම දැන් බුදුන් වහන්සේටත්, ධර්ම ශාඛාවටත් සම්බන්දයි කියා දැනෙනවා. ධර්ම ශාඛාව තුලදී, ඕනෑම දෙයක් අවංකව කතා කල හැකි අතර, මෙයා කියෝකයිචෝ සාන්ගෙන් හා ජ්‍යෙෂ්ඨ සාමාජිකයින්ගෙන් මගපෙන්වීම් ලබාගන්න පුළුවන්.

2020 වර්ෂයේ 01 වන මස, දෙමාපියන්ගේ නිවසට බුදු පිළිම වහන්සේ වැඩම කිරීමට අවස්ථාව ලැබිණි. ඒ සඳහා පවුලේ අයගෙන් විමසූ විට ඒ සඳහා අවසරය ද ලැබුණි. පවුලේ අය කරුණාවන්ත වූවා. බුදු පිළිම වහන්සේ තැම්පත් කරන උත්සවයේදී ජෝආන් ඔසාකි මහත්මිය සූත්‍ර

සජ්ජායනය (දෝෂි) සිදුකලා. ෂිබුචෝ කරෙන් ෆුජී මහත්මිය සහ තරුණ කණ්ඩායමේ මිතුරන්ද කැපවීමෙන් උදවු කලා. බුදුන් වහන්සේ තැම්පත් කර බුදුන් වහන්සේත් ආදි මුතුන් මිත්තනුත් ඉදිරියේ කල සූත්‍ර සජ්ජායනයේ ආශිර්වාදයෙන්, හදවත සැහැල්ලු වී ලොකු සතුටක් දැණුනා.

මේ වනතෙක්ම බොහෝ ප්‍රශ්න වලට මුහුණ දුන් මා හට, පවුලේ අය බොහෝ ලෙස උදවු කලා. පවුලේ අයට දුක් ගෙනදෙන බොහෝ දේ කලත්, වෙනසක් නොමැතිව සෑම විටම ලගින් සිටි ආකාරය මතකයට නැගෙන විට විශ්වාස කල නොහැකි තරම්ය. එසේ කලත් දැන්, පවුල් ජීවිතය ගැන ඇත්තේ කනස්සල්ලක් නොව මහත් සතුටකි. ටිකෙන් ටික වයසට යන දෙමාපියන්ට, වෙනදට වඩා ශක්තියක් වෙමින්, කුඩා කාලයේදී මග හැරුණු, දෙමාපියන් සමග කාලය නැවත ගතකරමින් සිටිනවා. තවද, අක්කාව හොදින් බලාගත හැකි විශ්වාසනීය මල්ලි කෙනෙක් වීමට කටයුතු කරමින් ඉන්නවා.

අතීතයේ මා නිතරම දෙමාපියන්ට කල අකටයුතුකම් (දුක් ගෙනදෙන දේවල්) කෙසේ ඉවසා සිටියේද කියා විමසූ විට, පුතා එකම වැරැද්ද දිගින් දිගටම කරන එක ගැන කලකිරී, මහ හිසරදයක් වුනා ලෙස පිලිතුරු දුන්නා. ඒත් සමගම, ඒ කාලයේ මා කිසිවෙකු කියන දෙයක් නොඅසන දඩබ්බර පුද්ගලයකු වූවා නේ....... කියා සිහියට නැගුන අතර දෙමාපියන්ගේ වචන හදවත පසාරු කරන් ගියාක් මෙන් දැනුනා.

දෙමාපියන් අවුරුදු ගානක්ම මගේ වැරදි ඉවසාගෙන, කවදා හෝ මා නිවැරදි මාර්ගයට පැමිණේ වී කියා විශ්වාස කලා. අද මා මෙතෙක් කල වැරදි වලට දෙමාපියන්ගෙන් සමාව අයදින අතර, මින් ඉදිරියට හොද දරුවකු වීමට අධිෂ්ඨාන කරමි.

ඉන් පසුව, පවුල් ජීවිතයක් ගත කිරීම සදහා මා සිතාසිටි ආකාරයේ ගෑණු ළමයෙක් මුණගැසුනා. මම ඇයට රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ විමට ආරාධන කල අතර, ඇය ද එය පිළිගෙන සම්බන්ද වූවා. පසුව මා 2021 වර්ෂයේ 3 වන මස 4 වන දින, බිරිද වන ජොරින් සමග විවාහ වූවා. සාමාජිකයින්ගේ සහ මෙයා කියෝකයිචො සාන්ගේ උදව්වෙන්, විවාහ උත්සවය ධර්ම ශාඛාවේදී පවත්වන්නට හැකියාව ලැබුනා. කොරෝනා වෛරසයේ අවදානම පැවති නිසාවෙන්, උත්සවයට පැමිණීමට හැකි වූයේ දෙමාපියන්ට සහ සමීපතම මිතුරන් කිහිප දෙනෙකුට පමණක් වුවද, චාම් ලෙස පැවැත්වීමට හැකි වූවා. මේ තරම් පිරිසක් සමග හෝ උත්සවය පැවැත්වීමට හැකිවීම ගැන අපි ඉතාමත් සතුටු වූවා.

විවාහයෙන් පසු, අප දෙදෙනා තව තවත් ශක්තිමත්ව බැදුනා. කරුණාවන්ත බිරිදක් ලෙස මට ආදරයෙන් සැලකීම ගැන මා බිරිදට හදවතින්ම ස්තූතිවන්ත වෙමි.

වයස අවුරුදු 20 ගනන් වල මුල් කාලයේ, ජලනල කාර්මික කටයුතු කෙරෙහි උනන්දුවක් තිබූ බැවින්, ජලනල තාක්ෂණය ගැන හා ඒ ආශ්‍රිත වැඩ වලට තිබූ දැඩි ආශාව නිසාම මා නගරයේ ජලනල කාර්මික සංගමයේ සාමාජිකයකු ලෙස දිනපතා සතුටින් රැකියාව කරමින් සිටිනවා. උදේ පාන්දරම රැකියාවට එන විට, ඇත්තටම මට මේ දේ කරන්න පුලුවන් වුනානේ කියා මහත් සතුටක් දැනෙනවා.

තවද, මට මගේ ආදි මුතුන් මිත්තන්ට ස්තූතිවන්ත හදවතක් ඇති කරගැනීමට හැකිවී තිබෙනවා. ආදි මුතුන් මිත්තන්ට ස්තූතිවන්ත වීම මගේ හදවතට මහත් සතුටක් ගෙන එනවා. තවද, පවුලට වඩාත් සමීප වී විශ්වාසවන්ත පුද්ගලයකු වීමට හැකිවීම ගැන ස්තූතිවන්ත වෙමි. අතීතයේ මා, කිසිවක් ගැන සැලකිල්ලක් නොදැක්වූ නමුත් වර්තමානය වන විට අවට සමාජයේ සෑම දෙයක් ගැනම සැලකිල්ලෙන්, ගෞරවයෙන් බැලීමට පුරුදුව සිටිනවා. සෑම දිනකම අවදි වූ විට, අද කුමක් කරන්නේද කියා තීරණය කරමින් දවස ආරම්භ කරන අතර, නරකක් (ප්‍ර ශ්නයක්) ඇතිවුවද, යමක් ඉගෙනීමට ලැබෙනවානේ යනුවෙන් සිතා, ස්තූතිවන්තව දවස ගෙවනවා.

එදිනෙද ජීවිතය තුලදී හමුවන මිනිසුන්, ලබන අද්දැකීම් තුලින් බුදුන් වහන්සේ නිතරම මට මග පෙන්වනවා. අතීතයේ සිදුවූ වේදනාකාරී සිදුවීම්, එම මාර්ගයේම ගමන් කරන පුද්ගලයින්ට උපකාර කිරීම සදහා අද්දැකිම් කියා මා සිතනවා. මොකද කියනවානම්, මට ඒ අයගේ හැගීම් තේරුම් ගන්න පුළුවන්. ඇත්තටම, මගේ හදවතේ දීප්තිමත් කර ගැනීමට හැකිවන ලෙස, හදවතේ බුද්ධ ශක්තිය ඔපදමා ගනිමින්, දිනපතා වර්ධනය වනවා.

මගේ ජීවිතයේ මා ගැන විශේෂ සැලකිල්ලක් දක්වා, මට බෝධිසත්ව මාර්ගයේ ගමන් කිරීමට අඩිතාලම සකසා දුන් සෑම කෙනෙකුටම හදවතින්ම ස්තූතිවන්ත වෙමි. මින් ඉදිරියට, කිසිවකටත් යටත් නොවී, ධර්මය ගැන හදවත් විවර කර, සමජයට වැඩදයී පුද්ගලයකු වීමට අධිෂ්ඨාන කරමි. අද දින මෙලෙස සෙප්පෝව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබාදීම ගැන හදවතින්ම ස්තූතිවන්ත වෙමි.



උත්සවයක් අවස්ථාවක මග පෙන්වන
ක්‍රිස් ක්‍රෙස්ගෙමහතා. (නීල් මත්සුෂිමා මහතා සමග)

# රිෂ්ෂෝ කෝසෙයි කායි හැඳින්වීම

## නික්යෝ නිවානෝ තුමාගේ ජීවිත කතාව සහ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉතිහාසය.

### ලොව පුරා පැතිරී යන රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය

මේ වන විට, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය ජපානය තුල පමණක් නොව, අමෙරිකාව, බ්‍රසීලය, එංගලන්තය, තායිවානය, තායිලන්තය, දකුණු කොරියාව, ඉන්දියාව සහ නේපාලය වැනි විදේශ රටවල් ගනනාවක ව්‍යාප්ත වී ඇති අතර, සාමාජිකයින් සතුටට පත් කිරීම සඳහාත්, ලෝක සාමය සාක්ෂාත් කරගැනීම සඳහාත් කැපවීමෙන් කටයුතු කරමින් සිටි. ජපානයේ සහ විදේශයන්හි සිටින විවිධ ආගමික පිරිස් ද, රිෂ්ෂෝ කෝසෙයි කායි හි ඉගැන්වීම් සහ ක්‍රියාකාරකම් ගැන වැඩි උනන්දුවක් දක්වන අතර, විශාල පිරිසක් ඒ සඳහා සහභාගී වේ.

30 දෙනෙකුටත් අඩු පිරිසකගෙන් ආරම්භ වූ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය, ලොව පුරා ව්‍යාප්ත වීමට හේතුව නම්, නිර්මාතෘ තුමාගේ සහ සම නිර්මාතෘතුමියගේ ඉගැන්වීම් වල විශිෂ්ඨත්වයයි.










ඔබේ දැනුමට

තුන් වැදෑරුම් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ලෝක වාසීන්ට ඉගෙන ගැනීම සඳහා, නිර්මාතෘ තුමා විසින් රචිත, 'තුන් වැදෑරුම් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ නව විවරණය' සහ 'බුදු දහමේ ජීවය සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයයි' යන පොත් විදේශ භාෂාවන්ට පරිවර්තනය කර ඉදිරිපත් කර ඇත.

※කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

## නිර්මාර්තෘ තුමාගේ සිට නිච්කෝ නිවානෝ තුමා දක්වා



නිච්කෝ නිවානෝ තුමා, 1938 දී නිර්මාතෘ තුමාගේ වැඩිමහල් පුතා ලෙස ඉපදුනා. යුධ සමයේදීත්, යුධ සමයෙන් පසුවත්, නිර්මාතෘ තුමාගෙන් වෙන්ව, මවට උදවු කරමින්, තම බාල සහෝදරයින්ව බලා ගනිමින් වසර 10 ක් සුගනුමා හි ජීවත් වූවා. පසුව පවුලේ අය සමග තෝකියෝවට නැවත පැමිණි අතර, එහිදී නිර්මාතෘ තුමාගේ (තම පියාගේ) ඉගැන්වීම් තුලින් බොහෝ පිරිසක් දුකින් මිදී සතුටට පත්වන ආකාරය දැක, පියාගේ විශිෂ්ඨත්වය ගැන පැහැදුණා යැයි පවසයි.

1991 දී ඔහු, රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ දෙවන සභාපති ලෙස පත්විය.



**ඔබේ දැනුමට**

නිච්කෝ නිවානෝ තුමා තම මව සහ සහෝදර සහෝදරියන් සමග, 1944 සිට වසර 10 ක් සුගනුමා හි ජීවත් වූවා. එම කාලය තුල නිර්මාතෘ තුමා තෝකියෝවේ තනිව ජීවත් වු අතර, ධර්ම පුහුණුවේ යෙදෙමින් කටයුතු කලා.



# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
(Address) 1031 Valencia Way, Pacifica, CA 94044, USA
(Mail) POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: lotusbuddhist@gmail.com
URL: https://sf-buddhism.org/

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
(Address) 2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
(Mail) POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: info@rkina.org
URL: https://www.buddhistcenter-rkina.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Rissho Kosei-kai International**

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**在家佛教韓国立正佼成会　Korean Rissho Kosei-kai**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571　FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
**Korean Rissho Kosei-kai of Busan**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571　FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會　Rissho Kosei-kai of Taipei**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633　FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會　Rissho Kosei-kai of Tainan**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478　FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai Society of Kolkata**
89 Srirampur Road (VIP), Garia, Kolkata 700084, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rampur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai Society of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216　FAX: 66-2-716-8218　Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406　FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka North**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhil**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960　Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949　Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247　Email: info@rkuk.org　URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230　FAX: 03-5341-1224　URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**